සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය

## චිත්‍ර කලාව

කාලය : පැය 02 යි.

නම/විභාග අංකය :-- ........................................................................... (I කොටස හා II කොටස සඳහා)

I ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.



01. මෙම රූපයෙන් දක්වෙන්නේ පහතරට සම්ප්‍රදායට අයත් ........................................................................... ශාන්ති කර්මයේ මඩු සැරසිල්ලයි.

02. ඉහත රූපය හා සම්බන්ධ ශාන්තිකර්මය ........................................................................... හා දෙවොල් දෙවියන් මූලික කරගෙන පැවැත් වූ බව සඳහන් වේ.

03. ඉහත රූපය හා සම්බන්ධ ශාන්ති කර්මයේ ...........................................................................ප්‍රධාන සැරසිලි අංගයයි.

04. මෙම ශාන්තිකර්මයේ දී කෙසෙල් පතුරු හා ........................................................................... සැරසිලි සඳහා භාවිත ප්‍රධාන අමුද්‍රව්‍ය වේ.

05. බෝවන රෝග ආදියෙන් මිදීම, ........................................................................... හා සශ්‍රීකත්වය ළඟා කර ගැනීම පදනම් කරගෙන මෙම ශාන්තිකර්මය පැවැත්වේ. (ලකුණු 2 5 5 = 10)

I **ප්‍රශ්න අංක 06 - 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) ඉස්ලාම් පල්ලියක නිර්මාණ අංගයක් වනුයේ,
(1) කුම්බාබිහිෂේකම් (2) මිනාර් කුළුණු (3) ගෝපුර (4) වාහල්කඩ

(7) නිල් වර්ණයට විසංගත වර්ණය වනුයේ
(1) දම් වර්ණය (2) කොළ වර්ණය (3) සුදු වර්ණය (4) තැඹිලි වර්ණය

(8) මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රමයක් වනුයේ,

(1) එකලස් කිරීමයි (2) අත් සකපෝරුව යොදා ගැනීමයි
(3) යටි පෝරුව යොදා ගැනීමයි (4) පින්තාරු කිරීමයි

(9) ශ්‍රී ලංකාවේ පාරම්පරිකව පැවත එන ජන කලාවක් වනුයේ,

(1) කාටුන් කලාව (2) නූල් රූකඩ කලාව
(3) සෙවනැලි රූකඩ කලාව (4) චිත්‍රපට නිර්මාණයයි

(10) හිඳි ප්‍රතිමාවක දෙපා පිහිටුවා ඇති ආකාරය

(1) ආසන ක්‍රමය නම් වේ. (2) මුද්‍රාව නම් වේ. (3) ආසනය නම් වේ. (4) ඉරියව්ව නම් වේ.

(ලකුණු 1 × 5 = 5)

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වගන්ති නිවැරදි නම් (3) ලකුණ ද වැරදි නම් (6) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

11. කොහොඹා කංකාරි ශාන්ති කර්මය සබරගමු සම්ප්‍රදාය සමඟ බැඳි ශාන්ති කර්මයකි. (..................)
12. අත් සකපෝරුව භාවිතයෙන් ඉතා විශාල භාණ්ඩ නිර්මාණය කළ හැකිය. (..................)
13. පැදුරු කර්මාන්තයේ දී රතු වර්ණය සකස් කරගැනීමට පතඟි දව භාවිත කරයි. (..................)
14. සූර්යා දිව්‍ය ගණයට අයත් සැරසිල්ලක් නොවේ. (..................)
15. කුෂන් කවර නිර්මාණය මුළුතල මෝස්තරයකි. (..................)

(ලකුණු 1 × 5 = 5)

**අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූප සටහන් උපයෝගී කර ගනිමින් පිළිතුරු සපයන්න.**


A


B


C


D


E

16. ත්‍රිභංග ඉරියව්ව දැක්වෙන්නේ .................................................. රූපය මඟිනි.
17. B රූපය මඟින් ........................................................ ක්‍රමයට හිඳ සිටින අයුරු දැක්වේ.
18. E රූපයෙන් දැක්වෙනුයේ ........................................................................ මුද්‍රාවයි.
19. විතර්ක මුද්‍රාව දැක්වෙනුයේ .......................................... රූප සටහන මඟිනි.
20. වජ්‍රාසනය ................................................ රූප සටහන මඟින් දක්වා ඇත. (ලකුණු 2 × 5 = 10)

**අංක 21 සිට 25 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වනසේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

21. කදිර්පායි ..........................................................................................................................................
22. ථූපසරය ...........................................................................................................................................
23. තන්තිරිමලේ .....................................................................................................................................
24. දිවමහනෙල් ......................................................................................................................................
25. අල්තාරය ..........................................................................................................................................

(ලකුණු 2 × 5 = 10)

I අංක 26 - 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.

26. හින්දු දේවාල තුළ දක්නට ලැබෙන ශිව දෙවියන්ගේ වාහනය වන සත්ත්ව රූපය කුමක් ද?....................................................

27. හිඳිපිළිම වල දක්නට ලැබෙන ධර්මය දේශනා කරමින් සිටින ආකාරය සංකේතවත් කෙරෙන මුද්‍රාව කුමක් ද?
.....................................................................................

28. මූලික වර්ණ දෙකක් එක සමානව මිශ්‍ර වීමෙන් සෑදෙන වර්ණය හැඳින්වෙන නම කුමක් ද? .............................................

29. වජ්‍රයක සලකුණක් සහිත ආසන කුමන නමකින් හැඳින්වේ ද? .............................................................................................

30. කොහොඹා කංකාරි ශාන්ති කර්මය අයත් නර්තන සම්ප්‍රදාය කුමක් ද? ..................................................................................

(ලකුණු 2 x 5 = 10)

## II කොටස

* පහත දැක්වෙන ''අ'' , ''ආ'' හා ''ඉ'' යන කොටස් තුනෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.

**''අ'' කොටස (ප්‍රකාශන චිත්‍ර)**

1. දිය කඩිත්තක් අසල නිදැල්ලේ හැසිරෙන වන සතුන්
2. ආගමික උත්සවයක බැතිබර මොහොතක්
3. දර කැඩුමට කැළයට ගිය ගැමි කාන්තාවන් පිරිසක්

**''ආ'' කොටස (මෝස්තර චිත්‍ර)**

4. මල් හා අලංකාර කොළ භාවිතා කරමින් චීත්ත රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්
5. නිර්මාණාත්මක සැරසිලි භාවිත කරමින් ඔසරි පල්ලුවක් නිර්මාණය කරන්න.
6. කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

**''ඉ'' කොටස (ග්‍රැපික් චිත්‍ර)**

7. ළමා කතන්දරයකට ගැළපෙන සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
8. පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න. (ලකුණු 50)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

(1) දෙවොල් මඩුව
(2) පත්තිනි දෙවියන්
(3) මඩුව සැරසීම
(4) ගොප් කොළ
(5) සෞභාග්‍ය

(6) 2
(7) 4
(8) 2
(9) 2
(10) 1

(11) 7
(12) 3
(13) 3
(14) 7
(15) 3

(16) C
(17) පද්මාසන
(18) ධ්‍යාන
(19) A
(20) D

(21) කෘෂි කර්මාන්තයේ දී නෙළන ලද ගොයම් පෑගීමට, වී වේලීමට, තම්බන ලද වී වේලීමට භාවිත කළ පැදුරු විශේෂයකි.

(22) චෛත්‍යයේ ආරක්ෂාව, ගෞරවය, පිණිස එය වටකොට තැනූ ගෘහයකි.

(23) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම් දක්නට ලැබෙන ස්ථානයකි.

(24) සිංහල සැරසිලි මෝස්තර අතර එන පුෂ්පයකි. නා ලොවට අයත් මලක් ලෙස සැලකේ.

(25) ක්‍රිස්තියානි දේවස්ථානයක දිග් ශාලාවේ කෙළවරක අලංකාර වැටක් සහිතව නිර්මාණය කර ඇති පූජාසනයයි.

(26) නන්දිගව රුව
(27) ධර්මචක්‍ර මුද්‍රාව
(28) ද්විතීයික වර්ණය
(29) වජ්‍රාසනය
(30) උඩරට නර්තන සම්ප්‍රදාය